**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.**

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන**

**අවසාන පරීක්ෂණය (දෙවන අධ්‍යයන වාරය) - 2006/2007**

**ESP 1110 - ප්‍රාථමික අධ්‍යාපනය**

**කාලය පැය තුනයි.**

---

දිනය - 2007.12.02 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

I කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II වන කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. "ප්‍රාථමික අධ්‍යාපනය" සංකල්පය කෙටියෙන් පැහැදිළි කරන්න.

02. 1997 සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල වැදගත් වෙනස්කම් දක්වන්න.

03. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ගුරු අධ්‍යාපනය හා පුහුණුව ගුණාත්මකව දියුණු කිරීම සඳහා වැදගත්වන යෝජනා තුනක් දක්වන්න.

04. 1992 දී ජාතික අධ්‍යාපන කොමිසම විසින් දක්වන ලද ජාතික අධ්‍යාපන අරමුණු පහක් ලැයිස්තුගත කරන්න.

05. විෂයමාලාව කළමනාකරණයේ දී ප්‍රාථමික ගුරුවරයකු විසින් සැලකිළිමත් විය යුතු ප්‍රධාන කරුණු පැහැදිළි කරන්න.

06. 'ඇගයීම' හා 'තක්සේරුකරණය' අතර වෙනස පැහැදිළි කරන්න.

07. ප්‍රාථමික ගුරුවරයකුට තම කාර්යයන් සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා සහය ලැබිය යුතු ක්ෂේත්‍ර නම් කරන්න.

08. ප්‍රාථමික අවධියේ ළමුන්ගේ ඉගෙනීම සුසාධ්‍ය කිරීමට දායකවන සාධක තුනක් නම් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - කොටස

09. I. ප්‍රාථමික අවධියේ ළමයකුගේ සංවර්ධනාත්මක චරිත ලක්ෂණ නම් කරන්න.
(ලකුණු 08)

II. ප්‍රාථමික අවධියේ ළමුන්ගේ සක්‍රීය ඉගෙනුමට දායකවන හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න.
(ලකුණු 12)

10. I. ශ්‍රී ලංකාවේ අවාසිදායක තත්වයක පසුවන ජන කොටස්වල ළමුන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය නිසි පරිදි ලැබීමට බාධාකාරී සාධක හඳුන්වන්න.
(ලකුණු 08)

II. ඉහත සඳහන් කරන ලද බාධාකාරී සාධක පිටු දැකීම සඳහා රජය සහ සමාජය විසින් කළයුතු කාර්යභාරය පැහැදිළි කරන්න.
(ලකුණු 12)

11. I. "පූර්ණ පෞරුෂ වර්ධනය ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රමුඛ කාර්යය විය යුතුය." මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

II. ප්‍රාථමික අවධියේ පසුවන ළමයකුගේ පූර්ණ පෞරුෂ වර්ධනය සහතික කිරීම සඳහා ප්‍රාථමික ගුරුවරයකු සතු වගකීම් සඳහන් කරන්න.
(ලකුණු 10)

12. I. ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක බව පවත්වා ගැනීමේ දී ශ්‍රී ලංකාවේ රජය මුහුණදෙන අභියෝග සඳහන් කරන්න.
(ලකුණු 10)

II. ඉහත සඳහන් කළ අභියෝග ජය ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරන්න. (ලකුණු 10)

13. I. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වන අවස්ථාවේ දී සාමාන්‍යයෙන් ළමයකු සතුවිය යුතු නිපුනතා විස්තර කරන්න.
(ලකුණු 08)

II. 21 වන සියවසේ අභියෝගවලට සාර්ථකව මුහුණදීම සඳහා ප්‍රාථමික අවධියේ ළමයකු වර්ධනය කරගත යුතු චරිත ලක්ෂණ පැහැදිළි කරන්න.
(ලකුණු 12)

14. පහත සඳහන් ඕනෑම තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. සුරක්ෂණය සඳහා ඇති අයිතිය
II. සහභාගිත්ව අයිතිය
III. අනිවාර්ය අධ්‍යාපන පනත
IV. ජෝන් ඩුවී (1859-1952)
V. ප්‍රාථමික ගුරුවරයා කළමනාකරුවකු වශයෙන්

(ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -